ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

1 වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2006/2007

නීති ක්‍රම - **LWU 1412**

කාලය - විනාඩි 40 යි

---

දිනය - 2006.09.05 වේලාව - පෙ.ව.11.30 - ප.ව.12.10 දක්වා

---

*<u>එක් ප්‍රශ්නයකට</u> පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

01. ප්‍රසිද්ධ නීතිඥයෙකු වන ගමගේ මහතා පරිඝනක අපරාධ පිළිබඳ වූ නඩුවක් මෑතකදී බාර ගන්නා ලදී. මෙම විෂය සම්බන්ධයෙන් කුමන නීතින් පාර්ලිමේන්තුව මගින් පනවනු ලැබ ඇත්තේ ද යන්නත්, කුමන නඩු තීරණයන්ට එළැඹ ඇත් ද යන්නත් සොයා බලන ලෙස ඔහු තමන්ගේ නව සහායක ප්‍රියන්තගෙන් ඉල්ලා සිටියේය. තවද මෑතකදී තීරණය වූ නඩු තීන්දුවක් විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙක් විසින් විවේචනාත්මකව විශ්ලේෂණය කරමින් ලිපියක් පළකර ඇති බවත් එය ද සොයා ගන්නා ලෙසත් ගමගේ මහතා ප්‍රියන්තට කීවේ ය.

(a) ගමගේ මහතා විසින් ඉල්ලා සිටින ලද තොරතුරු එක්රැස් කිරීම සඳහා ප්‍රියන්තට උපකාරී වන නීති ලේඛණ සොයා ගැනීමට ඔබගේ උපදෙස් පතයි. මෙම ලේඛණවල ස්වභාවය, ඒවායේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරමින් ප්‍රියන්තට උපදෙස් දෙන්න. (නෛතික ලේඛණ සාකච්ඡා කිරීම පමණක් සිසුන්ගෙන් බලාපොරොත්තු වන අතර පරිඝනක අපරාධ සම්බන්ධ දැනුම අපේක්ෂා නොකෙරේ.)

(ලකුණු 14)

(b) නීති වෘත්තියේ යෙදෙන ප්‍රියන්ත වැනි පුද්ගලයන්ට තොරතුරු එක්රැස් කිරීම සහ ගබඩා කිරීමට පහසු වන තාක්ෂණික මෙවලමක් ඇත් ද? ඔබගේ පිළිතුර පැහැදිළි කරන්න.

(ලකුණු 06)

02. "මුල් කාලයේදී විනිසුරන් විසින් ව්‍යවස්ථාවක වචන වල සරල අර්ථය යොදා ගැනීමෙන් බැහැර වූයේ කලාතුරකිනි. එයද අකමැත්තෙනි. වර්තමානයේ විනිසුරන් ව්‍යවස්ථාවක පරමාර්ථයට අනුකූලව නඩුවක් තීරණය කිරීමේදී වචන අතර සිර නොවේ."

ඉහත ප්‍රකාශ සමග ඔබ එකඟ වන්නේ ද? අදාළ නඩු තීරණ සහ අර්ථ නිරූපණ පිළිබඳ රීතීන් ඇසුරෙන් ඔබගේ පිළිතුර පහදන්න.

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -